# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.01.22 පැය 2340 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 123 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**හිටපු අමාත්‍යවරයෙකු වූ අනුර ප්‍රියදශර්න යාපා සහ ඔහුගේ බිරිඳ අත්අඩංගුවට ගැනීම - අපරාධ පරීක්ෂණ දෙපාතර්මේන්තුව.**

2025.01.22 වන අද දින සවස් කාලයේ හිටපු අමාත්‍ය අනුර ප්‍රියදශර්න යාපා සහ ඔහුගේ බිරිඳ අපරාධ පරීක්ෂණ දෙපාතර්මේන්තුව මගින් අත්අඩංගුවට ගෙන ඇත. ඔවුන් විසින් 2014 වෂර්යේ අග භාගයේදී බිංගිරිය හා නාරම්මල යන ප්‍රදේශවල ගංවතුරෙන් අවතැන් වූ පුද්ගලයින් හට සහන සැලසීමේ මුවාවෙන් ලංකා ඛණිජ තෙල් සංස්ථාවට අයත් රුපියල් 6,146,110ක මුදලක් ලබා ගෙන එම මුදල් අවතැන් වූ ජනතාවට සහන සැලසීම සඳහා භාවිතා නොකොට 2015 වෂර්යේ පැවති ජනාධිපතිවරණයේ ප්‍රචාරක කටයුතු සඳහා යොදවමින් මහජන මුදල් සාපරාධී සාවද්‍ය පරිහරණය කිරීම හා පොදු දේපල පනතේ ගැනෙන වැරදි සිදු කිරීම හේතුවෙන් ගරු නීතිපති තුමාගේ උපදෙස් මත මෙම අත්අඩංගුවට ගැනීම සිදු කර ඇත.

මෙම සැකකාර හිටපු අමාත්‍යවරයා සහ ඔහුගේ බිරිඳ 2025.01.23 වන දින කොළඹ ගරු මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතව ඇති අතර මේ සම්බන්ධව අපරාධ පරීක්ෂණ දෙපාතර්මේන්තුව වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**